වගා සහනාධාර චක්‍රලේඛ අංක 25

මගේ අංකය:
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ. 1474, කොළඹ.
1990.01. 25 දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත.

වගා සහනාධාර ගෙවීම් සඳහා ඉඩම් හිමිකම්
තහවුරු කිරීම - රජයේ ඉඩම්

1988.05.18 දිනැති සං/ව.අ/ප්‍රති සහ අංක 173 දරණ චක්‍රලේඛයට අමතරවයි.

02. දැනටමත් තේ වගාව සහිත රජයේ බදු ඉඩම් තේ නැවත වගාව සහ පාළු පැළයීම් සඳහා සහනාධාර ඉල්ලුම් කිරීමේදී යථෝක්ත චක්‍රලේඛයේ රජයේ ඉඩම් යටතේ (ආ), (ඇ) සහ (ඇ) යටතේ දක්වා ඇති අදාල ඉඩමේ හිමිකම් සහතිකය සමග අමුණා එවිය යුතු තේ වගා කිරීමට දිසාපති/ප්‍රාදේශීය උප දිසාපති අවසරය දී ඇති ලිපිය ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. මෙවැනි ඉඩම්වල හිමිකම් සහතිකයේ පිටපතක් (එල් ඩී ඕ බලපත්‍රය වැනි) සමග එන්.පී/2ඒ ආකෘති පත්‍රය මගින් ඉඩමට ඇති හිමිකම තහවුරු කරගත යුතුය. දැනට භාවිතා කරන එන්.පී/2 ඒ ආකෘතියේ වම් ඉහළ කෙලවරේ ඇති "පුද්ගලික (රජයේ නොවන) ඉඩම් සඳහා සම්පූර්ණ කළයුතුය." යන්න කපා ඉල්ලුම් පත්‍ර නිකුත් කළයුතු අතර, සංශෝධනය සඳහන් රබර් මුද්‍රාවක් යථා කාලයේදී ඔබ වෙත සපයනු ලැබේ.

03. ඔබගේ පහසුව තකා චක්‍රලේඛ අංක 173 හි පිටපතක් මෙයට අමුණා ඇත.

ආචාර්ය සරත් බී. මහන්වත්ත
සභාපති.

පිටපත්:-

1. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්.
2. ප්‍රාදේශීය කාර්යාල වගා සහනාධාර අංශවලට අයත් සියලුම නිලධාරීන්
3. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.

ක/-

පිටපතකි.

<u>චක්‍ර ලේඛ අංක: 173</u>

මගේ අංකය:-සං/ව ආ/ප්‍රති
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
තැ.පෙ.1474,
කොළඹ.
1988.05.18 දින.

සියලුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,

<u>වගා සහනාධාර ගෙවීම සඳහා ඉඩම් හිමිකම තහවුරු කිරීම</u>.

අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම තේ වගා සහනාධාර ක්‍රම සඳහා සහභාගි වීමට ඉල්ලුම් කරන ඉඩම් සම්බන්ධයෙන් පහත දැක්වෙන පරිදි එම ඉඩම්වල ඉල්ලුම්කරුවන්ට ඇති හිමිකම තහවුරු කරගත යුතුය.

<u>පෞද්ගලික ඉඩම්</u>:

විධිමත්ව සම්පූර්ණ කරන ලද එන්පී/2ඒ ආකෘතියෙහි සමා දාන විනිශ්චයකාර වරයකු ඉදිරියේ දිවුරා කරන ලද ප්‍රකාශයක් මගින් <u>හෝ</u>

ප්‍රාදේශීය කළමණාකරුගේ අභිමතය පරිදි අයදුම්කරු විසින් විශේෂ ඉල්ලීමක් කරන අවස්ථාවකදී එන්.පී/2ඒ ආකෘතියෙන් බැහැරව ප්‍රාදේශීය කළමණාකරු, නියෝජ්‍ය ප්‍රාදේශීය කළමණාකරු හෝ ප්‍රාදේශීය ව්‍යාප්ති නිලධාරි විසින් මුල් ඔප්පුව පිරික්සා ඉල්ලුම්කරුට ඉඩම හිමි බව සනාථ කෙරෙන සටහනක් ඡායා පිටපතෙහි යෙදීමෙන්.

<u>රජයේ ඉඩම්</u>:

(අ) ඉඩම් ප්‍රදාන සහතික පත්‍රය(ස්වර්ණ භූමි ඔප්පුද ඇතුළුව) <u>හෝ</u>

(ආ) ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රය(එල්.ඩී.ඕ.බලපත්‍රය) සහ ඉඩමේ තේ වගා කිරීමට දිසාපති/ප්‍රාදේශීය උප දිසාපති අවසර දී ඇති ලිපිය <u>හෝ</u>

(ඇ) දිසාපති හෝ ප්‍රාදේශීය උප දිසාපති විසින් ඉල්ලුම්කරුට ඉඩමේ ඇති හිමිකම සනාථ කොට තේ වගා කිරීම සඳහා අවසර දී ඇති ලිපිය <u>හෝ</u>

(ඇ) ඉල්ලුම්කරුට ඉඩමට ඇති හිමිකම සම්බන්ධයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂමේ ව්‍යවස්ථාපිත නිශ්චය( Statutory Determination ) <u>හෝ</u> ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂම හෝ වෙනත් රාජ්‍ය ආයතනයකින් නිකුත් කරන ලද ලිපියක් සහ එම ඉඩමේ තේ වගා කිරීමට එකී රාජ්‍ය ආයතනයේ අවසරය.

තේ වගා කිරීම සඳහා අවසර පත්‍රයක් හෝ අවසර දෙනු ලබන ලිපියක් නිකුත් කිරීමට පෙර ඉහත පරිදි ඉඩමේ හිමිකම තහවුරු කරගත යුතුය.

මෙම චක්‍රලේඛය 1988.06.01 දින සිට ක්‍රියාත්මක විය යුතුය. එන්පී/2ඒ ආකෘති පත්‍රය ඔබ විසින් නිකුත් කරන සියලුම ඉල්ලුම්පත්‍ර කට්ටලවලට අඩංගු කළ යුතුය.

අත්සන් කළේ:වී.කේ.නානායක්කාර
සභාපති

පිටපත්:-
1. සහකාර සාමාන්‍යාධිකාරි(මුදල්)
2. සහකාර සාමාන්‍යාධිකාරි(සංවර්ධන)
3. ලේකම්/පාලන සහකාර
4. අභ්‍යන්තර විගණක
5. සියලුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්.